317

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය

නීති අධ්‍යයන දෙපාර්තමේන්තුව

නීතිවේදී (ගෞරව) උපාධි පාඨමාලාව - 03 වන මට්ටම

අවසාන පරීක්ෂණය 2022/ 2023

නීති ක්‍රම සහ නීති රචනය - LLU3602

කාලය - පැය තුන (03) යි.

දිනය : 2024 පෙබරවාරි 25 වේලාව : ප.ව. 1.30 - ප.ව. 4.30

මුළු ප්‍රශ්න ගණන : 08

**I කොටසින් ප්‍රශ්න දෙකක් (02) හා II කොටසින් ප්‍රශ්න තුනක් (03) ද ඇතුළුව මුළු ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.**

**අපේක්ෂකයන්ගේ අපැහැදිලි අත්අකුරු සඳහා ලකුණු අඩුකරනු ලැබේ.**

## I කොටස - නීති රචනය

**මෙම කොටසින් ප්‍රශ්න දෙකකට (02) පමණක් පිළිතුරු සපයන්න.**

1. (අ). නීතිමය තර්ක ගොඩනැගීමට භාවිතා කරනු ලබන උද්ගාමී හේතු දැක්වීම සහ නිගාමී හේතු දැක්වීම යන විධික්‍රම සංසන්දනය කරන්න.

**(ලකුණු 10)**

(ආ). (i). නීතිමය පිළිතුරක් තුළ විවේචනාත්මක රචනය යන්නෙන් ඔබ වටහා ගන්නේ කුමක්ද?

**(ලකුණු 02)**

(ii). නීතිමය පිළිතුරක් විවේචනාත්මකව ලිවීමේ වැදගත්කම පිළිබඳව කෙටි සටහනක් ලියන්න. අවශ්‍ය අවස්ථාවන්හිදී උදාහරණ සපයන්න.

**(ලකුණු 08)**

**(10+02+08 = ලකුණු 20)**

2. (අ). නීතිමය මූලාශ්‍ර කියවීමේදී භාවිතා කළ හැකි පහත දැක්වෙන තාක්ෂණික ශිල්ප ක්‍රම විශ්ලේෂණය කරන්න.
   - I. පිරික්සා බැලීම (Scanning)
   - II. පිටපත් කිරීම (Skimming)
   - III. අවධානය යොමු කළ කියවීම (Focused reading)

**(ලකුණු 10)**

(ආ). (i). නඩු වාර්තාවක විවිධ කොටස් ලැයිස්තුගත කරන්න.

**(ලකුණු 05)**

(ii). ඔබ විසින් ඉහත ලැයිස්තුගත කර ඇති සෑම කොටසක්ම විස්තර කරන්න.

**(ලකුණු 05)**

**(10+ 05+ 05 = ලකුණු 20)**

3. (අ). නඩු සටහන් ලිවීමේ ක්‍රියාවලිය පියවරෙන් පියවර විස්තර කරන්න.

**(ලකුණු 12)**

(ආ). නෛතිකමය හේතු දැක්වීම සඳහා පහසුකම් සපයනු ලබන IRAC (ගැටලු, රීතීන්, අදාල කිරීම සහ අවසානය) ක්‍රමවේදය කෙටියෙන් පරීක්ෂා කරන්න.

**(ලකුණු 08)**

**(12 + 08 = ලකුණු 20)**

## <u>II කොටස - නීති ක්‍රම</u>

**මෙම කොටසින් ප්‍රශ්න <u>තුනකට (03)</u> පමණක් පිළිතුරු සපයන්න.**

4. අධිකරණ පූර්ව නිදර්ශන න්‍යාය හා සම්බන්ධ පහත දැක්වෙන සංකල්ප හඳුනාගෙන අවශ්‍ය උදාහරණ සපයමින් ඒවා සාකච්ඡා කරන්න.

(අ). නඩුවක අවසාන තීන්දුව සඳහා පාදක වන මූලික සිද්ධිමය කරුණක් හෝ හේතු දැක්වීමේ දාමය.

(ආ). නඩුව විසඳීමට අවශ්‍යයෙන්ම දායක නොවිය හැකි, සහ, එබැවින් එය වෙනත් අධිකරණ කෙරෙහි නීතිමය වශයෙන් බන්ධනීය නොවන නමුත් අනාගත නඩුවලදී මඟපෙන්වීමේ අධිකාරියක් ලෙස සඳහන් කළ හැකි විනිසුරුවරයෙකුගේ පොදු යෝජනාවක් හෝ නිරීක්ෂණයක්.

(ඇ). වැරදි ලෙස දී ඇති සහ පූර්ව තීන්දුවක් විනිසුරුවරුන් විසින් අනුගමනය කිරීමට අදහස් නොකරන විට.

(ඈ). පහළ අධිකරණයක හෝ සමාන ස්ථරයක අධිකරණයක පූර්ව තීරණයක් ප්‍රතික්ෂේප කිරීම සහ අවලංගු කිරීම. එහි ප්‍රතිඵලයක් ලෙස, පූර්ව තීරණය ශූන්‍ය සහ බලරහිත වන අතර නව තීරණය පැරණි තීරණය සඳහා අධිකාරයක් ලෙස ආදේශ වීම.

**( 4 x 5 = ලකුණු 20)**

5. "සාධාරණත්වය හඳුන්වාදෙනු ලැබුවේ නීතියේ දෘඪතාවයක් ඇති විටෙක යුක්තිය සාක්ෂාත් කර ගැනීමට නොහැකි වීමේ පදනම මතය."

ඉහත ප්‍රකාශය අනුසාරයෙන්, නීති මූලාශ්‍රයක් ලෙස සාධාරණත්වයේ වැදගත්කම පරීක්ෂා කරන්න. ඔබේ පිළිතුර ප්‍රායෝගික නිදර්ශන සහ නඩු තීන්දු මගින් තහවුරු කළ යුතුය.

**(ලකුණු 20)**

6. ලකාසා යනු මකාරා රාජ්‍යයේ මධ්‍යම කඳුකරයේ වනාන්තරවල ජීවන වන ආදිවාසී ප්‍රජාවකි. මකාරා රාජ්‍යයේ පැරණි සම්ප්‍රදායන් සහ චාරිත්‍ර අවලෝකනය කරමින් තම ප්‍රජාවේ අනන්‍යතාවය ප්‍රකාශ කිරීම සඳහා ලකාසා ජනයා සෑම වසරකම මාර්තු මාසයේදී 'ලුලු' නම් උත්සවය සමරයි. නීති ශිෂ්‍යාවක වූ හාලා, පර්යේෂණ කටයුත්තක් සඳහා මෙම උත්සවයට පැමිණි අතර, ලකාසා ප්‍රජාව 'ලුලු' උත්සවයේදී මුවන්, හාවන් සහ කුළු හරකුන් වැනි වන සතුන් ඝාතනය කිරීමේ බිලි පූජා චාරිත්‍රයක් සිදු කරන බව වටහාගත්තාය. මෙම ඝාතන මකාරා රාජ්‍යයේ 'නීතිවිරෝධී ලෙස වන සතුන් දඩයම් කිරීම වැළැක්වීම' පිළිබඳ පනතේ විධිවිධාන උල්ලංඝණය කිරීමක් බව, හාලාට පෙනී ගියාය. පනතේ 02 වගන්තියේ පහත පරිදි දැක්වේ.

" කිසිම පුද්ගලයෙක් කිසිම අභයභූමියක දඩයම් කිරීම, වෙඩි තැබීම, මරා දැමීම හෝ වන සතුන් අල්ලා ගැනීම හෝ කිසිදු කුරුල්ලෙකු හෝ උරගයෙකුගේ බිත්තර විනාශ කිරීම නොකළ යුතුය."

එබැවින්, ලුලු උත්සවයේදී දෙවියන් උදෙසා වන සතුන් බිළිදීමේ චාරිත්‍රය අභියෝගයට ලක් කරමින් හාලා විසින් නඩුවක් ගොනු කරන ලදී. ලකාසා ප්‍රජාවේ නායකයා තර්ක කරනු ලැබුවේ, මෙම චාරිත්‍රය තම මුතුන් මිත්තන්ගේ කාලයේ සිටම පවතින බවත්, බිළිදීමෙන් දෙවියන් සතුටු කිරීම නිසා තම ප්‍රජාව වන සතුනගේ ප්‍රහාර වලින් ආරක්ෂා වන බවත්, මෙලෙස බිළි පූජාව සිදු කිරීමෙන් තොරව මෙම උත්සවය සම්පූර්ණයෙන් ඉටු කළ නොහැකි බවත්ය.

මෙම නඩුව සම්බන්ධයෙන් පවතින නීතිමය ගැටළු පිළිබඳව අවධානය යොමු කරමින් වාර්තාවක් කෙටුම්පත් කරන ලෙස ඔබෙන් ඉල්ලා ඇති බව උපකල්පනය කරන්න. මෙම බිළිපූජා චාරිත්‍රය වලංගු චාරිත්‍රයක් ස්ථාපනය කරන්නේද යන්න පිළිබඳව හබකාර පාර්ශවයන්ට උපදෙස් ලබා දීමේ අදහසින් ඔබේ වාර්තාව සකස් කළ යුතු වේ.

අදාළ ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන සහ නඩු තීරණද ඇතුළත්ව ඔබේ වාර්තාව සකස් කරන්න. තවද, මකාරා රාජ්‍යයේ නීතිය, ශ්‍රී ලංකාවේ නීතියට සමාන බවට උපකල්පනය කරන්න.

**(ලකුණු 20)**

7. "දේශීය නීතිය තුළ අන්තර්ජාතික සම්මුතීන් සඳහා වන බන්ධනීය ස්වභාවය, ප්‍රශ්නගත රාජ්‍යය අන්තර්ජාතික නීතිය තුළ තමාව ඉදිරිපත් කරන්නේ කෙසේද යන්න මත රඳා පවතී."

   නීති මූලාශ්‍රයක් ලෙස අන්තර්ජාතික සම්මුතීන් යන්න සම්බන්ධයෙන් ඉහත ප්‍රකාශය පරීක්ෂා කරන්න. අවශ්‍ය අවස්ථාවන්හි උචිත උදාහරණ සපයන්න.

**(ලකුණු 20)**

8. පහත දැක්වෙන මාතෘකා සම්බන්ධයෙන් කෙටි සටහන් ලියන්න.

   I. නීතිය වර්ගීකරණය.
   II. උඩරට නීතියේ සංවර්ධනයෙහිලා නීතිවේදීන්ගේ දායකත්වය.
   III. අධිකරණ පූර්ව නිදර්ශන න්‍යායෙහි ක්‍රියාකාරීත්වය සඳහා වන මූලික සාධක.
   IV. ශ්‍රී ලංකාවේ නීති වෘත්තිය.

**(5 x 4 = ලකුණු 20)**

***~~ හිමිකම් ඇවිරිණි~~***